# 2021 අප්‍රේල් මස 01 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ 2021 අප්‍රේල් මස මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී.සුසන්ත පෙරේරා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.ගාවින් මත්තෙස් මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |

40. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
41. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය
42. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
43. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
44. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
45. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩි.තාරක මුණසිංහ මහතා විසින් 2021.04.01 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. වාර්තාව පිළිගැනීම හා සලකා බැලීම

2021.03.04 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව.

**මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2021.03.04 දින සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු යයි මා යෝජනා කර සිටිනවා.

**මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි,වාර්තාවේ 29 වන පිටුවේ මම ඉදිරිපත් කරපු බොහෝ කරුනු සඳහන් වෙලා නැහැ. මෙතන නාමපුවරු මොන පෙර පාසැලේද කියලා කියනවා සඳහන් වෙලා නැහැ. මම ඉදිරිපත් කරනවා කලින් කමිටුවේ ආපු නිර්දේශය පිලිබඳව ඒක සඳහන් සඳහන් වෙලා නැහැ. ඊලඟ කමිටුවේ ගත්තු නිර්දේශය සඳහන් කරනවා එය සඳහන් වෙන්නේ නැහැ. 31 පිටුවේ මම කරපු ප්‍රකාශය අගක් මුලක් සඳහන් වෙන්නේ නැහැ මටම ලැජ්ජා හිතෙනවා කියවුවාට පස්සේ.මොනවද මම කියලා තියෙන්නේ කියලා. මම ඉල්ලීමක් කරනවා රෙකෝඩින් එක නැවත අහලා සංශෝධනයක් කරන්න කියලා වගකීම් විරහිත වාර්තාකරණය පිලිබඳව මගේ අප්‍රසාදය මම පල කර සිටිනවා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමිය, විශේෂයෙන්ම ලේකම් තුමා අදාල වෙන්නාවූ කරුනු සම්බන්ධයෙන් කමිටු වාර්තාවේ සවිස්තරාත්මකව තියෙනවා නම් සංශෝධනයකට අවශ්‍ය වෙන්නේ නැහැ. කරුණු වාර්තා වෙලා නැත්නම් සංශෝධනය පිලිබඳව සලකා බලන්න.

**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, මෙම වාර්තාව පිලිබඳව අපට තියෙනවා විශේෂ බරපතල ප්‍රශ්ණයක් ගිය මස සභාවේදි ඔබ හොඳටම දන්නවා කමිටු යෝජනා සාකච්ජා කිරිමේදි විශේෂයෙන් මුදල් කමිටුව සාකච්ජා කිරිමේදි ඊට විරුද්ධව ඔබතුමා නැඟිටලා යනවා. එතනින් ඔබ්බට මේ සභාවේ න්‍යායපත්‍රානු කූලව කිසිදු සිද්දියක් සිදු වෙන්නේ නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම නැඟිටලා ගියේ නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා,මට කථා කරන්න දුන්නේ නැහැ.මේ වාර්තාවට අනුව 02.12 වන දින මුදල් කමිටුව අංක 09 ට විරුද්ධවත් අනිකු සියලුම කරුනුවලට පක්ෂවත් පහත නම් සඳහන් මන්ත්‍රීවරු ජන්දය දුන්නා කියලා. මුදල් කමිටුවේ එක කාරණාවකට අපි විරුද්ධ වුනා කියනවා අනෙක් කාරනා වලට පක්ෂ වුනා කියලා. ගරු නගරාධිපතිතුමනි ඒකම බරපතල වරදක්.බරපතල නැත්නම් සරළ වරදක්. ඒ නිසා ඔබේ ස්ථාවරයේ ඔබ ඉන්නවා වගේම අපේ ස්ථාවරයේ අපි ඉන්නවා.කමිටුව සාකච්ජා කිරිමට දිය යුතුයි කියන තැන. ඒ නිසා අපට අදහස් පල කරන්න නොදිම කියන කාරනාව නිසා මුදල් කමිටුවට අපි විරුද්ධ වෙනවා. හැබැයි මේ වාර්තාව කියවපුවම එක කාරණාවකට ඇරෙන්න අපි මුදල් කමිටුවට පක්ෂ වුනා වගේ අදහසක් මේ වාර්තාවේ දෙනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒක නිවැරදි කරන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ සභාවේ පුද්ගලික ස්වභාවයේ කරුණු නැත. වෙනත් කරුණු නැත.මේ සභාවේ මන්ත්‍රීවරු දන්නවා ඒ අවස්ථාව ලැබුනේ නැහැ. ඒ නිසාම කොමසාරිස්තුමනි ලේකම් තුමනි , අපිට සැක හිතෙනව ඔබතුමන්ලාත් පොහෝට්ටුවෙමද කියලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා,ඕක කියන්නත් මෙතන අවස්ථාවක් නැහැනේ. වාර්තාවේ කරුනු විතරක් කියන්න.ඒ වෙලාවට ඒ අවස්ථාව ගන්න.

මහා නගර සභා මන්ත්‍රී,ඩබ්.මැක්සි.ජේ ප්‍රනාන්දු මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2021.03.04 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන -</u>

02(1) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අද දින මාසික සභා රැස්විමට සහභාගි නොවන බව යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මන්ත්‍රීතුමා ලිපියක් එවලා තියෙනවා.

02(2) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අසනීප තත්ත්වය නිසා අද දිනයේ මාසික සභා රැස්වීමට සහභාගි නොවන බව ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂන මන්ත්‍රීතුමා දැනුම් දිලා තියෙනවා.

02(3) **නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මහ නගර සභා මන්ත්‍රී, ඒ.දීපා චාන්දනි ආරියවංශ මහත්මිය අද දිනයේ සභාවට සහභාගි නොවන බව දන්වා එවා තියෙනවා.

## 03. සභාව අමතා එවන ලද ආයාචනා,පෙත්සම්,පැමිණිලි හා සංදේශ සභාව හමුවේ තැබීම.

3(1) **මහ නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි,මා වෙත පෙත්සම් දෙකක් ලැබිලා තියෙනවා සුරේෂ් ජෝශප් මහතා විසින් කුරුස හංදියේ ඉදිකල බුදු පිලිමය ඉවත් කිරිම සම්බන්ධව. ගරු නගරාධිපතිතුමනි මේ ලිපියෙන් තියෙන්නේ බුදුපිලිමය නිසා හට ගන්නට ගිය තත්වය ඔබතුමා මැදිහත් වෙලා ඒ බුදු පිලිමය ඉවත් කිරිම සම්බන්ධව ඔබතුතමාට ස්තුති කරලා.මම ඒ බුදු පිලිමය වීඩියෝ දර්ෂන වලින් දුටුවා ඉතාමත්ම අලංකාරව නිර්මාණය කරලා තියෙනවා.ඒ වගේම මේ බුදු පිලිමය නිසා හට ගන්නට ගිය මගේ ප්‍රදේශයේ මෝල්පෙ බේරුවල ආනන්ද රාම විහාරස්ථානයේ විහාරාධිපති ආනන්ද ස්වමීන් වහන්සේගේ මුලිකත්වයෙන් ඒ වීඩියෝ දර්ශන වලින් මා දුටුවා ඒ හිමිනම ඉන්නවා ඒ නිසා මම හිතනවා මේ පෙත්සමෙන් ඉල්ලිම කරලා තියෙනවා.කුරුස හංදිය කියන්නේ ඉතාමත්ම ෛඑතිහාසිකව වැදගත් කමක් තියෙන ස්ථානයක්.1766 වර්ෂයේදි කුරුස හංදිය ස්ථානගත වෙන්නේ.කෙසේ වෙතත් මේ සිද්ධිය ලොකු ප්‍රශ්ණයක් නොවි ඉතා හොඳින් විසඳුනා කියලා මම හිතනවා. ඔබතුමාගේ මැදිහත් විම නිසා එනිසා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මා කියනවා මේ බුදු පිලිමය සංඝයා වහන්සේලා අපේ නිලධාරින් එකතු වෙලා යම්කිසි සුදුසු ස්ථානයක යලි ස්ථාපනය කරන්න කියලා මා යෝජනා කර සිටිනවා.

**මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**

ගරු නගරාධිපතිතුමනි, මේ පෙත්සමේ කියන්නේ මොකක්ද කියලා අපි දන්නේ නැහැ. කවුද තිබේ කියලාවත් අපි දන්නේ නැහැ මේ බුදුපිලිම වහන්සේ. අපිට අනවසර ඉදිකිරිමක් තිබුනා අපි ඉවත් කලා.මේ බුදුපිලිමය නැවත වරක් ස්ථාපනය කරන්න කියලා යෝජනා කිරිමක් අවශ්‍ය නැහැ නගරාධිපතිතුමා. වීඩියෝ කොහෙද ආවේ කියලා අපි දන්නේ නැහැ.

3(2) **මහ නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, එස්.ගනේගම මහතා ඉදිරිපත් කරලා තියෙන්නේ. ලුනාව ශරිර සුවතා මධ්‍යස්ථානයේ ඇති දැන්විම් පුවරුව සම්බන්ධයෙන්. මේ ස්ථානයේ දැන්විම් පුවරු දෙකක් ස්ථාපනය කරලා තියෙනවා. ඒ සියලු නඩත්තු වියදම් සඳහන් වෙනවා ඒක හොදයි. ගරු නගරාධිපතිතුමනි ඒ යට පේලියේ සඳහන් වෙනවා කේළාම් කියන පහත් ගති තියෙන ඔය වගේ වචන ටිකක් තියෙනවා මා හිතන්නේ ඒ පුවරුවේ ඒ වචන ටික නොතිබුනා නම් හොදයි.මේ ලිපියෙන් මෙතුමා ප්‍රකාශ කලා වගේම මමත් ප්‍රකාශ කරනවා ඒ වචන ටිකට වඩා ශරිර සුවතාව පිණිස වචන ටිකක් එකතු කරලා ඒ දැන්විම් පුවරුව සකස් කරන මෙන් ඉල්ලා සිටිනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඉල්ලීමක් කරනවා ඒ වචන නැත්නම් ඒකට ඇතුලත් කරන්න වචන ටිකක් ඔබතුමා කියන්න.

**<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මම කියන්නම් සුදුසු වෛද්‍ය උපදෙස් කීපයක් ව්‍යායාම් කිරිමට අදහස් කීපයක් මා යෝජනා කරන අතර ගරු නගරාධිපතිතුමනි ඔබතුමා දන්නවා මේ ඇවිදින මන්තීරු අතරේ එක එක වර්කස්ලා එන්න කලින් ඔබතුමා මේ මන්තිරුවේ ඇවිදීම් කටයුතු අපි කලා අපිත් පැමිණිලි කීපයක් කලාම ඔබතුමා එම ස්ථානයට පැමිණියා එතන ගේට්ටුවක් තිබුනේ නැහැ අපි ඔබතුමාට කථා කලා විදුලි ආලෝකය තිබුනේ නැහැ.අපි කියපු සැනින් ඔබතුමා පැමිණ ඒ අඩුපාඩු අපිට සකස් කරලා දුන්නා. ඒ සඳහා විශේෂ ස්තුතියක් කියන අතරම මේ කාරණය ගැනත් සලකා බලන්න කියන මගේ ඉල්ලීම කරනවා.

**3(3)** **<u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ශ්‍රී රාහුල මාර්ගයට අයිති දොලොස් දෙනෙක් පදිංචි වෙලා ඉන්න අතුරු මාර්ගය එය සභාවට පවරාගෙන සංවර්ධනය කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**3(4)** **<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අද දවසේ සභාව තුල අසුන් වෙන් කිරිමේදි යම්කිසි වෙනසක් අපිට දකින්නට ලැබෙනවා ඒ සම්බන්ධව අපේ විරෝධතාවට ඔබතුමාට දක්වනවා. අවුරුදු 3 ක් ගතවෙලා අවසන් වසරට යනකොට මේ වෙනස් කිරිම සිදු කරන්න කොපමණ සදාචාරාත්මකද කියන එක ප්‍රශ්ණයක් තියෙනවා. මෙය මොරටු දේශපාලන ඉතාමත් සාමකාමි දේශපාලනයක්.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මුලසුනට කථා කරන විදියට පක්ෂයට කථා කරන්න.මට කථා කරලා වැඩක් වෙන්නේ නැහැ. ඕක අදාල එකක් නොවෙයි හැන්සාඩ් එකෙන් අයින් කරනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පක්ෂයේ ලේකම්ගේ ඉල්ලීම සම්බන්ධව ඔබතුමාට ක්‍රියාත්මක වෙන්න බැහැ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා,ඇයි බැරි මට ක්‍රියාත්මක වෙන්න පුලුවන්. ගරු මන්ත්‍රතුමා මට මෙතන රාජකාරිය ඔබතුමා උගන්වන්න එන්න එපා. ඔබතුමා පක්ෂයත් එක්ක ඒක බේර ගන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රිවරු 10 දෙනෙක් අත්සන් කරලා ඔබතුමාට භාරදීලා තියෙනවා අපේ කණ්ඩායම් නායක ගරු සේනක දමයන්ත ද සිල්වා මහතා එතුමා අවුරුදු 25 ක් පලාත් සභාවේ සේවය කරලා තියෙන ජොෂ්ඨ මන්ත්‍රිවරයෙක්. ඔබතුමාට යම්කිසි දවසක මේ වගේ අසාධාරණයක් අපි එතන කථා කරනවා. මේක කරන්න එපා මෙහෙම. පුද්ගලිකව පලි ගැනිමකට ලක් කරන්න එපා. මහ නගර සභා ආඥා පනතේ මෙය ඇතුලත් නැහැ.මේ කණ්ඩායම් නායකයා. වැඩිම මන්ත්‍රිවරුන්ගේ මනාපය තමයි මෙතන නායකත්වය දැරිය යුතුයි කියන එක. මෙය ඉතාමත්ම නරක පූර්වාදර්ශයක් බවට ඉදිරියේදි පත්වෙනවා කියන එක මේ අවස්ථාවේදි ප්‍රකාශ කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, විශේෂයෙන්ම තිසර මෙන්ඩිස් මන්ත්‍රිතුමා පුටුවක් ඉදිරියට ඇවිල්ලා දැන් කථා කරනවා පුටු ගැන.මේක මේ මම කරන එකක් නොවෙයි. අනිත් එක විපක්ෂ නායක කියන තනතුර පලාත් පාලන ආයතන තුල කොහෙවත් නැහැ. පලාත් පාලන ආයතන මෙතන දෙපැත්තට නැහැ එකට තියලා ජේෂ්ඨත්වය මත කුමන පක්ෂය හෝ ඉන්න පුලුවන්.උප නගරාධිපතිතුමා ඇරුනම ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂයේ ගාවින් මත්තෙන් ගරු මන්ත්‍රිතුමාට වාඩි වෙන්නත් පුලුවන්.එතන කිසි ගැටලුවක් නැහැ. ඒක පනත. නීතිය. සම්ප්‍රදාය තමයි මේ ක්‍රියාත්මක වෙන්නේ. සම්ප්‍රදායක ලෙස පක්ෂයෙන් දෙන එක තමයි අපි පිලිඅරගෙන තියෙන්නේ.ඊට වඩා දෙයක් මෙතන නැහැ. ඒක තමයි අපට කරන්න වෙලා තියෙන්නේ.ඔබතුමා ඒකට ගරු කරලා තමයි ඔබතුමා ඔය පුටුවේ නොවෙයි නේ හිටියේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඉතිහාසයේ මේක කවදාවත් වෙලා නැහැ. වැඩිම මන්ත්‍රිවරුන්ගේ කැමැත්ත තියෙන්නේ එතුමාට.දෙපිලක් බෙදුනේ නැහැ විපක්ෂය.අපි කියන්නේ ඔබතුමාට ඒ පුටුව එතුමාට කියන්න.ඒක ලේකම් කරන එකක් නොවෙයි පුටුව දෙන එක.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා,ගරු මන්ත්‍රිතුමා ඔබතුමා මට සම්ප්‍රදාය උගන්නත් එපා. නීතිය උගන්වන්නත් එපා.විපක්ෂයේ නායක කම ගරු ලේකම්තුමා සේනක දමයන්ත ද සිල්වා මැතිතුමාට දීලා වුනත් මට පුලුවන් සම්ප්‍රදාය ක්‍රියාත්තමක කරන්න යන්නේ නැතුව එතනම තියන්න පුලුවන්. විපක්ෂනායක වෙන්න පුලුවන් හැබැයි එතුමට එන්නේ විපක්ෂ නායක අවසන් පුටුව නම් ජොෂ්ටත්වය අනුව එතුමව එතන තියලා විපක්ෂ නායක ඉන්න පුලුවන්. නගර සභාවේ කියලා නැහැ විපක්ෂ නායකට පලවෙනි පුටුව දෙන්න කියලා. නගරාධිපති එක නම් නියෝජ්‍ය නගරාධිපති ජොෂ්ඨත්වය ඇතුව හෝ නැතුව දෙක.එතනින් එහාට පනතේ කියලා නැහැ. ගරු මන්ත්‍රිතුමා,ඔබතුතමාට අමතක වෙලා තියෙන්නේ පක්ෂ දේශපාලනය කරන්න බැරි දෙයක් නැහැ ඔබතුමාගේ පියා රාජාලියාට ගිහිල්ලා නැවත ආවාට පස්සේ උපනගරාධිපතිකම දුන්නා නෝමන් මයත්මයාව එලවලා. මේ පක්ෂය විසින් කරපු දේ තමයි අපි කරලා නැහැ. ඔබතුතමා අතීතය අමතක කරන්න එපා. මේක පක්ෂය කරපු දෙයක් මිසක් අපි කරලා නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම දන්න විදියට වැරදි පූර්වාදර්ශයක් මේ සභාව තුල ස්ථාපනය කරන්න හදනවා තිසර මන්ත්‍රීතුමා. ජෝෂය මන්ත්‍රීවරයෙක් අපේ පක්ෂයේ හිටපු. මෙතුමා දැන් බේදයට ගිහිල්ලා අපට පේන්නේ වෙන ගමනකට මේ සභාව හසුරුවන්න යනවා මෙතුමා. පක්ෂයේ මහ ලේකම් වරයෙක් දිපු තනතරක්. පක්ෂ මහ ලේකම්වරයාදිපු තනතරක් අපිත් එදා විපක්ෂ නායක විදියට සේනක දමයන්ත මන්ත්‍රීතුමාවව විපක්ෂ කණ්ඩායම් නායක කරන්න කියලා මමත් අපි හැමෝම විපක්ෂයේ අපි 16 දෙනාම අත්සන් කරලා දුන්නා. පක්ෂ මහ ලේකම් වරයා තමයි මහ නගර සභාවට ලිපි එවන්නේ විපක්ෂ නායක විදියට පිලිගන්න කියලා. විපක්ෂනායක විදියට ඔබතුමා ඒක සභාගත කලා. එහෙම නම් එදා බජට් එක දවසේ තිබුනානේ ගාවින් මහත්මයාව විපක්ෂ නායකයා කරන්න.මොකද බහුතරය එදා 10 නොවෙයි තිබුනේ එදා 24 ක් විතර මෙතුමාට කැමැත්ත තිබුනා. මේ පුද්ගලික අදහසක් මෙතන සභාවේ ප්‍රකාශ කරන්න බැහැ නගරාධිපතිතුමනි. ඔබතුමා ප්‍රකාශ කරනකොට පක්ෂ මහ ලේකම්ගේ ලිපිය එදා නැගිටලා යන්න නොවෙයි මෙතුමන්ලට තිබුනේ විසඳගෙන යන්න.බොරුවට මේ සභාව වැරදි පැත්තකට ගෙනියන්න එපා කියලා සඳහන් කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මෙතුමන්ලාගේ මූලික තර්කය බහුතරයක් අත්සන් කරලා දීම නිසා ඒ අයට විපක්ෂ නායක කම දෙන්න කියලා. මේක පූර්වාදර්ශයක් තියෙනවා පාර්ලිමේන්තුවෙ. 2015 පස්සේ ඒකබද්ද විපක්ෂයක් කියලා බිහි වෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ඡන්දය ඉල්ල්ලපු පිරිසක් මහින්ද රාජපක්ෂ ගරු ජනාධිපතිතුමා වගේම විශාල පිරිසක් අත්සන් කරලා දෙනවා විපක්ෂ නායක කම මහින්ද රාජපක්ෂ මැතිතුමාට දෙන්න කියලා. නමුත් එක්සත් ජනතා නිදහස් සංධානයේ ලේකම් ඒකපිලිගන්නේ නැහැ. එතකොට මහින්ද රාජපක්ෂ මැතිතුමා විපක්ෂ නායක වෙන්නේ නැහැ.එතන විපක්ෂනායක තනතුරක් තියෙනවා. ඒ සියල්ල තිබියදි තමයි පිලිගත්තේ නැත්තේ.මෙතන මෙතුමන්ලා ඉදිරිපත් කරන්නේ නැති තනතුරක්. සම්ප්‍රදායිකව තියෙනවා ඇත්ත නමුත් කිසිදු තනතුරක් නැති තත්වයක් ඇතුලේ එතුමන්ලා කියනවා නම් අපි 10 දෙනෙක් අත්සන් කරලා දුන්නට පස්සේ පිලිගන්න කියලා ඒක බල රහිතයි ගරු නගරාධිපතිතුමනි. පක්ෂ ලේකම්ගේ බලය මන්ත්‍රීරයෙකුට ආදේශ කර ගන්න බැහැ නගරාධිපතිතුමනි. අපි කැමති වෙන්නත් පුලුවන් අපි කාටවත් අභියෝග කරන්න අයිතියක් නැහැ ගරු නගරාධිපතිතුමනි.

3(5) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පුටු වලට තනතුරු වලට කෑදර දේශපාලනයෙන් තොර දේශපාලන ව්‍යාපාරයෙක් විදියට අවුරුදු 23 නගර සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස පිටිපස්සේ ඉදිමින් තමන්ගේ කාර්යභාරය ඉටු කරනවා අපිට පුටුවල , තනතුරු වල ප්‍රශ්ණ නැහැ. අපි ඇවිල්ලා තියෙන්නේ ජනතාවගේ ප්‍රශ්ණ කථා කරන්න.

ගරු නගරාධිපතිතුමනි කටුබැද්ද ගාර්ඩන් සිටි තිස්ස ප්‍රනාන්දු මහතා විසින් ප්‍රදේශ වාසීන් අත්සන් කරපු ඉල්ලිමක්.මීට වසර 2 කට පෙර ඒ ප්‍රදේශයේ අතුරු මාර්ගය තාර දමා

තිබෙනවා ඒ සම්බන්ධයෙන් සුරංග මන්ත්‍රීතුමාට ඒ ජනතාව විසින් ස්තුති කරනවා. ඒ පාරේ එක කොටසක් තියෙනවා කාණුව බෝක්කුව සම්බන්ධ ගැටලුවක්. වසර කිපයක් තිස්සේ බෝක්කුව එලෙසම පවතිනවා. ජල බැස්ම නිසියාකාරව සිදු වෙන්නේ නැහැ.සමස්තයක් වශයෙන් ගත්තොත් මුලු මොරටුවෙම කාණුවල ජල බැස්ම සිදු වෙන්නේ නැහැ.ඒවා නිසි ප්‍රමිතියෙන් යුක්තව සිදුවෙලා නැහැ කියලා චෝදනාව තමයි එල්ල කරන්න තියෙන්නේ එහි ප්‍රතිපලයක් ලෙස ගාර්ඩන් සිටි එකේ මා පුද්ගලිකව ගිහිල්ලා මේ ස්ථානය නිරික්ෂණය කලා.වැස්සක් වැස්සට පස්සේ එතන ජලය රැදෙනවා ප්‍රධාන කාණුවට ගලා යාමක් නැහැ. ඒ පිලිබදව මම තාක්ෂණ නිලධාරිගෙන් විමසුවාම එතුමා මට කියපු පිලිතුර තමයි ඒ පිලිබද ලොකු උත්සහායක් දැරුවා නමුත් ඒක කර ගන්න බැරි වුනේ පරන ලුනාව ව්‍යාපෘතියක අදාල ප්‍රධාන කාණු  මේ කාණුව සම්බන්ධ කරද්දි මැදින් හරියට ලෙවල් වෙලා ඒ නිසා අපට කරගන්න අමාරුයි කියන කාරනාව තමයි තාක්ෂණ නිලධාරි මහතාගේ පැත්තෙන් ආවේ. ඒක අපිට පිලිගන්න බැහැ නගරාධිපතිතුමනි අපි ඉංජිනේරුවරු පත්කරගෙන ඉන්නේ මේ සභාවේ කිසියම් හෝ විසඳුමක් ඒගොල්ලො තමයි ලබා දෙන්න ඕන. අපිට බැහැ ඉංජිනේරු කාර්ය භාරය කරන්න. ඕනැම ප්‍රශ්ණයකට විසඳුමක් තියෙනවා.ඒ උත්තරය හෙයලා බලලා ඉටු කිරිම තමයි අපේ වගකිම. එම නිසා මේක අපේ විශේෂ ඉල්ලිමක් අවුරුදු කීපයක් තිසේසේ ඉල්ලනවා. ඔබතුමාලා එල්ලපු බෝඩ් එකකුත් මම කියෙවුවා. ලක්ෂ 10 කට අධික මුදලක් වියදම් කරනවා. පාර ප්‍රතිසංස්කරනය සහ බෝක්කුම සෑදීම සදහා. අපට ප්‍රශ්ණයක් එනවා බෝක්කුව හදලා නැහැ පාර හදලා තියෙනවා හැබැයි ලක්ෂ 10 ක් ගිහිල්ලා තියෙනවා.  එතකොට මෙතන සාදාරණ සැකයක් එනවා මොකක්ද මෙතන සිදු වුනේ. ඒකත් මම විමසිමක් කලා තාක්ෂණ නිලධාරි මහත්මයාගෙන් මොකක්ද මෙතන කියලා ඒ ඉතුරු වුන මුදලෙන් පාරේ ඉතිරි ප්‍රමාණය හැදුවා කියලා. එහෙම නම් ඔබතුමාලා බෝඩ් එකේ දාන්න තිබුනේ  මේ පාර මේ ප්‍රමාණයෙන් සංවර්ධනය සඳහා මෙපමණ මුදල් ප්‍රමාණයක් වැය වුනා එතකොට ඒක සාධාරණයි. හැබැයි බෝක්කුවකුත් මේකට එබුවට  පස්සේ බෝක්කුව හදලා නැහැ හැබැයි ලක්ෂ 10 ක් වියදම් වෙලා තියෙනවා. එතකොට අපිට සාධාරණ සැකයක් එනවා මෙතන වංචාවක් වුනාද කියලා.මේ කටයුතු කරද්දි මීට වඩා විනිවිද භාවයෙන් යුතුව නිවැරදිභාවයෙන්  කරන්න කියන ඉල්ලිම කරනවා ගරු නගරාධිපතිතුමනි. මේ ලිපිය  මම සභාගත කරනවා. ඒ කටයුත්ත ඉෂ්ඨ කරලා දෙන්න කියලා  ප්‍රදේශවාසින් වෙනුවෙන් ඉල්ලා සිටිනවා.

3(6) **<u>මහ නගර සභා මන්ත්‍රී  - ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව සමස්ත කතෝලික ජනතාවගේ ස්තුතිය පුද කරනවා මේ මොහොතේදි. මොරටුව තුල ව්‍යසනයක් ඇති වෙන්නට ගිය මොහොතේදි පෙරමුණ අරගෙන කිසිම කෙනෙකුට හැඟවෙන්නේ නැතුව ක්‍රියාකලාපයක් නිහඬව ඉෂ්ඨ කලා. මැල්කම් රංජිත් කාදිනල් තුමා පෞද්ගලිකවම ඔබ තුමාට ස්තුති කලා.

3(7) **<u>මහ නගර සභා මන්ත්‍රී  - එම්.ශිරෝමී ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,මා වෙත ලැබුනු පෙත්සමක් ඉදිරිපත් කරන්නේ.5 වන පටුමග සිට මොරටුමුල්ල,දෙසට හැරෙන මංසන්ධිය තෙක් භූගත නල මාර්ගය කලක සිට අවහිර වී ඇති බැවින් ජලය දුර්ගන්ධයක් පවතින නිසා පයින් ගමන් කිරිමට අපහසු වන තරමට පාර ජලයෙන් යටවෙන නිසා නිලධාරින් කිහිපදෙනෙකු පැමිණ පරික්ෂා කලා. නමුත් මෙම

තත්වය සමනය කිරිමට කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බැවින් මේ පිලිබඳව සොය බලා කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා. ගරු නගරාධිපතිතුමනි මම ජනවාරි, පෙබරවාරි මාස වලදි මේ වගේ ඉල්ලීම් ඉදිරිපත් කලා නමුත් කිසිදු ක්‍රියා මාර්ගයෙක් නැහැ.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රිතුමිය, මම ඔබතුමියට උපදෙසක්, අවවාදයක් දෙනවා කියලා හිතන්න එපා. මෙහෙම දෙයක් කරන්නකෝ.ඔය පැත්තේ අපි ඉන්න කොට අපිට මන්ත්‍රිවරු හිටියනේ පාර්ලිමේන්තුවේ රවිනාත් ගුණසේකර ගරු නගරාධිපතිතුමා ඉන්නවා ආණ්ඩුවත් ඔබලාට තියෙනවා. අපි විපක්ෂයේ ඉන්නකොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන අරගෙන අපේ ගම්වල වැඩ කරනවා. මන්ත්‍රීවරුන්ට කියලා එක්ක දෙකක් හරි කරගන්නකෝ.

**මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමී ඉන්දිකා කුරේ මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, අපි පාරවල් 177 ක් හැදුවා ගරු නගරාධිපතිතුමනි.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රිතුමිය,ඒක නොවෙයි මම මේ කිව්වේ.ඔබතුමිය පටලවා ගන්න එපා. ඔය හැදුවේ ආණ්ඩු පක්ෂයේ ඉන්න කොටනේ අපි හැදුවේ විපක්ෂයෙන් ඉන්නකොට.

**මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමී ඉන්දිකා කුරේ මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට එහෙම කියන්න සාධාරණ අයිතියක් ඇති කියලා මම හිතන්නේ නැහැ. බදු මුදල් ගෙවන ජනතාවගේ ඉලලීම් ඉදිරිපත් කරන්න එක අපේ වගකිම හා යුතුකම බව ඔබතුමා හොඳටම දන්නවා.ඔබතුමා අපි යෝජනාවල් ඉදිරිපත් කලාම ඒවා නොසලකා හරින බව අපි දන්නවා. අද දවසේ අපේ උද්ගත වෙලා තියෙන ප්‍රශ්ණය ඔබතුමා දකින් ඇති මහින්ද අලුත්ගමගේ මැතිතුමා රන්ජන් රාමනායක මැතිතුමාට විරුද්ධව නඩුවක් පවරලා තිබුනා එතුමා ඒක ඉල්ලා අස්කර ගත්තා. මම කියනවා වෛරී දේශපාලනය මොරටුවෙන් තුරන් කරමු අපි. ගරු සේනක දමයන්ත මැතිතුමා වෙනුවෙන් ඔබතුමා එහෙම නම් ඔබතුමා මේ ආසන සියල්ලක්ම වෙනස් කරන්න ඕන. මේක අඩකවයක් ආකාරයට. ඔබතුමා මේ න්‍යායන්වලට නොගිහිල්ලා පක්ෂයේ ප්‍රශ්ණයකින් ඔබතුමා රසවිදින බව අපි දන්වා මොරටුවේ දේශපාලනයෙන් අපි හැමෝටම ආදර්ශයක් දෙමු.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රිතුමිය,කුහුඹුවන්ටත් නායකයන් ඇත්තේය අපට නායකයන් නැත්තේය.

**3(8)** **මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව ප්‍රදේශයේ කුණු කසළ ප්‍රශ්ණය ගැන නැවත නැවත කථා කිරිමට සිදුවිම ගැන කණගාටු වෙනවා. ජනතාව හරි දේ කරන ක්‍රමවේදයට අනුගත කිරිම සඳහා අපි කාල සටහනක් දිලා ජනතාව දැනුවත් කලා. සොයිසා පුර ප්‍රදේශයේ දිරණ කුණු ටික හරියට කරනවා. මම කොමසාරිස්තුමාවත් දැනුවත් කලා ද්‍රවිඩ භාෂාවෙන් කථා කරන අයට නෝටිස්

එකක් හෝ බැනර් එකක් හෝ දාන්න කියලා. තවම සමහර අය දැනුවත් නැහැ ඒ නිසා මේ කාල සටහන හරි ක්‍රමවේදයට ගේන්න ටිකක් උදවු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**3(9) මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, තෙලවල කුලවර්ධන පාර කෙළවරේ හා යෝගාශ්‍රම මාවතේ කෙලවර පදිංචි නිවාස 30 ක පදිංචි කරුවන්. ඔවුන්ගේ නිවාස ආසන්නයේ ඇති වගුරු බිම සිද්ධාලේප ආයතනය විසින් ගොඩකරන බැවින් වැසි කාලයේදි ඔවුන්ගේ නිවාස වැසි ජලයෙන් යටවන බව තමයි දැනුම් දිලා තියෙන්නේ. ඒ අය ඉල්ලා සිටින්නේ ගරු නගරාධිපතිතුමනි සත්‍ය කාරණාවක්. සිද්ධාලේප කියන්නෙත් අපේ ජාතික ආයතනයක්.ඒ නිසා අපේ ආයතනය විසින් මෙය ගොඩ කරන්නේ නීත්‍යානුකූලවද, ඉඩමට ඔප්පුවක් තියෙනවද කියලා, ඒ සියලු වගකිම් සපුරලාද කියලා සොයා බලලා ඒ කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**3(10) මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, ද සොයිසා නවෝදයා පාසැලේ විදුහල්පතිතුමා ලිපියක් ඉදිරිපත් කරනව පාසැල් කාලය ආරම්භ කර තිබෙන නිසා පාසැල අවට වල්බිහිවි ඇති බැවින් සේවකයන් යොදවා තණකොළ කපන යන්ත්‍රයකින් පිරිසිදු කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**3(11) මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, තව කරුණක් තියෙනවා මොරටුව මහ නගර සභාවේ යම් යම් අංශවල සේවය කරන සේවකයන්ට සෑම වසරකම නිල ඇඳුමක් හෝ ඒකට අදාල දීමනාවක් ලබා දෙනවා. නමුත් මගේ දැනගැනිම අනුව වසර 3 ක පමණ කාලයක සිට ඒ සේවකයන්ට ලබා දිලා නැහැ නගරාධිපතිතුමනි ඒකට හේතුව දැනගන්න කැමතියි.

**3(12) මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, රටතුල කතිකාවක් යනවා පිළිකා කාරක පොල්තෙල් සම්බන්ධව මොරටුව අපි ආසයනයක් විදියට නගර සභා සීමාව තුල ජනතාව ඉදිරියේදි ඒ පොල්තෙල් පරිබෝජනය කිරිම සම්බන්ධව ගත යුත්තේ කුමක්ද කියලා. ඒ වගේම රට තුල ගස් කොළන් කැපිම සම්බන්ධවත් ගැටලුවක් තියෙනවා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, නිල ඇඳුම් සම්බන්ධව මම හිතනවා අපේ නිලධාරින් විසින් ගන්නා ලද පියවර පිලිබඳව මමත් ඉන්නේ අසතුටෙන්. විශේෂයෙන්ම 2018 දුන්නද කියලා මම දන්නේ නැහැ.හිටපු කොමසාරිස් මාන්නප්පෙරුම මැතිතුමා අපි රු.4000/- ක් දිගෙන එනකොට එතුමා ඒ රු.4000/- නවත්වලඑතුමාගේ හාල් මෝලේ තියෙන හාල් ටික ගෙනල්ලා පැකට් කරලා ඒකට තව ආම්පන්න ටිකක් එකතු කරලා දුන්නම අපේ සේවකයෝ අත්පොඩි ගහලා මගේ දෙයියා මෙහෙම දෙයක් දිලා නැහැ කියලා කිවුවා. රු.4000/- නැති කලා.එහෙම කරලා සේවකයන්ව සැනසුවා. එතන සිට තවම නිල ඇඳුම දීමනාවත් නැහැ නිල ඇඳුමත් නැහැ. ඒ වෙලාවේ ගත්ත පූර්වාදර්ශය එහෙමම තවම ගේනවා. එකේදි අපේ දැන් ඉන්න සමහර මන්ත්‍රීවරුත් ගිහිල්ලා අත්පුඩි ගැහුවා. සමහර අපේ සේවකයෝ ස්තුති ප්‍රසස්ති ගායනා ගැයුවා.හැබැයි එහෙම කියලා මාන්නප්පෙරුම මහත්මයාට දෝෂාරෝපණයක් කරන එක නොවෙයි කරන්න ඕන අපේ අය

ඒක නිවැරදි කරන්න ඕන. කරුණාකරලා ඒ අයගේ නිල ඇඳුම අරගෙන දෙන්න.අපි සුසාන භූමයට ගියාම කියනවා හරියට ඇඳුම අඳින්න කියලා දෙන්නේ නැතුව අඳින්න කොහොමද. දුන්න ඇඳුම අඳින්නේ නැත්තම් හැම වාරෙකම පඩියෙන් කපන එක වෙනම දෙයක්.පනතේ තියෙනවා කපන්නට පුලුවන් මුදල.කරුනාකරලා දෙන්න මේ වසරේ මාස 4 ක් ගෙවිලා. නියෝජ්‍ය කොමසාරිස්තුමා ඔබතුමාගේ සමහර ක්‍රියාකලාපයන් වලදි දැන් ආදායම් පරික්ෂක ඒ වගේ උඩ ඉන්න අයගේ ඒවා සම්පූර්ණයෙන් සිදු වෙනවානේ. නිල ඇඳුම ඇන්දේ නැති වුනත් මුදල හරි ගිහිල්ලා ඇති. පහල ඉන්න අයට මේක නැහැ.ඒක නිසා ඔවුන්ට ඒක දෙන්න.

**3(13)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,කොරළවැල්ල මෝසස් පටුමගේ ඉල්ලීමක් ඉදිරිපත් කරන්නේ. මීට පෙර ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමාගේ අරමුදලින් වැසි ජලය බැස යාම සඳහා මාර්ගය ඉදි කලා. නමුත් මේ වෙනකොට ප්‍රදේශවාසීන් මහත් අපහසුතාවයකට පත්වෙලා තියෙනවා.ඒ සඳහා යොදා තිබෙන නල මාර්ගය කුඩා වීමත්, මාස දෙකකට වත් වරක් එය පිරිසිදු කිරිම අවශ්‍ය වෙනවා. සභාවේ මුදල් යොදවා ඉදිකරනවා නමුත් ඒවා ගැන පසුවිපරමක් කරන්නේ නැති නිසා අපරාධයක් වෙනවා.එම නිසා ඒ ඉල්ලිම ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**3(14)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මම මෙය ඔබතුමාට ලිඛිතව බාර දුන්නා. සමාජවාදි පෙදෙසේ 131/1 ස්ථානයේ පෞද්ගලික ඉඩමක ඉදිකර ඇති වහලය අනතුරු දායක තත්වයක් උදාවෙලා තියෙනවා මේ වෙනකොට සුළං හමනකොට ඒ තහඩු ගැලවිලා පාරට විසිවෙනවා. එය හැකිතාත් ඉක්මනින් පරික්ෂා කරලා ඉවත් කරදෙන මෙන් ඉල්ලා සිටිනවා.

**3(15)** **<u>මහ නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මට පොඩි වෙලාවක් දෙන්න. රවින්ද්‍ර රංගන මන්ත්‍රිතුමාට ස්තුතියක් කරන්න ඕන එතුමා ඒ කාරණාව මතුකිරිම සම්බන්ධයෙන්. මෙය පසුගිය වැසි සමයේ මම කර්මාන්ත අංශයට ගොස් අදාල නිලධාරින්ට දිගින් දිගටම කිවුවා මෝසස් පටුමගේ මේ ප්‍රශ්ණය තියෙනවා ඒ අවස්ථාවාට අපිව සැනසෙන උත්තරයක් දිලා එවනවා ගරු නගරාධිපතිතුමනි. ආණ්ඩු පක්ෂයෙන් නිසා අපි සභාවේ කථා නොකර ඉන්නවා. නමුත් දැන් හරි ඉංජිනේරු තුමිය වග බලා ගනිවි කියා හිතනවා. ඒ වගේම කොරලවැල්ල සද්ධර්මෝදය සහ මෝසෙස් ලේන් එක අතර මාර්ගය දිගටම වැසි ජලයෙන් යටවෙනවා මම ඒයත් ඉදිරිපත් කරලා තියෙන්නේ. මට නම් කියනවා මෙකට හොඳම දෙයක් කරන්න පුලුවන් නමුත් තවම කෙරිලා නැහැ. ඒ ගැනත් මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**3(16)** **<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මට නගර සභාවෙන් සිදුවුන අසාධාරණයක් තියෙනවා කථා කරන්න.ඔබතුමා හොඳටම දන්න දෙයක්. මගේ නමට වරිපනම් හරවා ගන්න එකක්. මට කිවුවා නඩු තින්දුව අරගෙන එන්න කියලා. මම ගෙනත් දුන්නම බලලා කිව්වා මහරගම ගිහිල්ලා සීල් එක ගහගෙන එන්න කියලා. මගේ නමට තියෙන්නේ ජනුවින් ඔප්පුවක් වින්තා කියන ලොකු නෝන තමයි කිව්වේ.ඊට පස්සේ කියනවා බිම් සවිය අරගෙන එන්න කියලා. මේ කරන්න කාටද මොරටුව මහ නගර සභාවේ මම ජොෂ්ඨ මන්ත්‍රීවරයෙක්. මම ඔබතුමාට කිව්වාම ඔබතුතමා මේ

පැත්තේ ඒ පැත්තට බෝලේ දැම්මා. අන්තිමට මේක කරන්න ම බැහැ. මාස දෙකක් මම දිව්වා. ජෝෂය මන්ත්‍රීවරයෙකුට මෙහෙම නම් මොරටුවේ ජනතාව මොන තරම් දුක් විදිනවාද නගර සභාවෙන් මේ වගේ දෙයක් කර ගන්න බැරුව. කොච්චර වැරදිද හරිම අසාධාරණයක් මම කෝටි ගානක් නැති කරලා තියෙනවා නගරාධිපතිතුමා දන්නවා පසුගිය ජනාධිපතිවරණයෙක් ලක්ෂ 135 ක් මම පැරදිලා තියෙනවා. ඒ ඔට්ටු ඇල්ලුවේ මහින්ද මහත්මයා වෙනුවෙන්. ගමටම ලොකු දෙයක් කරන්න මම කථා කරලා කෙරුවේ.ඔබතුමාට ගිය මහා මැතිවරණයේ මම ගොඩක් උදවු කරා. සල්ලි වලින් ලක්ෂයක් දුන්නා. බෙන්ස් කාරෙකක් ගෙදර තියෙනවා ඕන වෙලාවක අරගෙන යන්න. එහෙම කරපු අපිටද මේ කරන්නේ හරිම දුකයි. මම ඔබතුමා ලගට ඇවිල්ලා කථා කරලා කිව්වා මේ වගේ මිනිස්සුන්ගෙන් පලි ගන්න දේශපාලනයෙන් පලි ගන්න කුහක පාලනයක් මේ මොරටුව ඉතිහාසයේ ලැබිලා නැහැ. මම ඔබතුමාට කිව්වා මේක යූ එන් පි නගර පාලනයක් වුනානම් මම දන්නවා තත්පරයකින් කරගන්නවා කියලා. නමුත් මෙතුමාගේ පාලනය නිසා අපිට කරගන්න බැහැ. හරි දුකයි. කෝටි ගානනක් නැති කරලා තියෙනවා අපේ පක්ෂය වෙනුවෙන්. මේ වගේ සභාවල ඉන්නවට වඩා හොඳයි ගෙදර යනවා.(මේ අවස්ථාවේදී මහා නගර සභා මන්ත්‍රී, යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා සභා ගැබෙන් පිටව ගියහ.)

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මම හිතනවා එතුමා හිටියානම් හොඳයි. අපේ ගරු මන්ත්‍රී අත්පොඩි ගහපු යූ.එන්.පි අය අත්පොඩි ගැහැව්වේ පිටිපස්ස පැත්තෙන්ද කියලා මම දන්නේ නැහැ.කොහෙන් ගැහැව්වුත් සද්දෙ එන්වා. ඒ පැත්තෙන් ගැහැවුවොත් ටිකක් ගඳයි. ඒක නිසා විශේෂයෙන්ම මම හිතනවා එක්සත් ජාතික පක්ෂය පැත්තේ හිටපු සනි මන්ත්‍රීතුමා රවිනාත් ගුණසේකර මැතිතුමා ඉන්න කාලේ ඇත්ත ඇති සැටියෙන් කථා කරන්න අපි මොන වෙලාවකවත් පැකිලෙන්නේ නැහැ. එතුමා ගෞරවනීය විදියට හරියටම එතුමා මේ පුටුවේ ඉන්නකොට සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රතුමා ඉන්න පුටුවේ ඉඳගෙන 2002-2006 වකවානුවේ එතුමා කියනවා අපේම ගරු මන්ත්‍රවරුන්ට අනුන්ගේ ඉඩමක් ජේන්න බැහැ, පල්ලියක ඉ ඩමක් ජේන්න බැහැ, පන්සලක ඉඩමක් ජේන්න බැහැ. ප්‍රකාශන ඔප්පුවක් සාදාගන්නවා.නීතිඥ මහත්මියක් උනාට නොතාරිස් කෙනෙක්ද කියලා මම දන්නේ නැහැ. ඕන වෙලාවක මට පුලුවන් ඔබතුමියගේ ඉඩම තව කෙනෙක් ලගට ගිහිල්ලා ප්‍රකාශණයක් කියලා ලියා ගන්නට පුලුවන්. ඒක වලංගු නැහැ මේ රටේ. වලංගු නැති ඉඩමක් ගැන තමයි ඔය කියන්නේ. මම අදටත් වඳින්න ඕන තැන්වල මම වඳිනවා මගේ වැඩිමහල් සහෝදර මන්ත්‍රීවරුන්ට. වැඳ-වැඳ පිං දෙනවා සනී මන්ත්‍රීතුමාට අත්පොඩි ගහන්න එපා එතුමා කරපු දේ නිසා තමයි මොරටුව පොලිසිය ඉදිරිපිට තිබෙන කතෝලික සභාවේ නායකතුමා ඉන්න ඉඩම හිටපු යූඑන්පි මන්ත්‍රීවරයෙක් එක්ක එකතු වෙලා ප්‍රකාශන ඔප්පුවක් ගහල සනී මන්ත්‍රතුමාට පිං සිද්ධ වෙන්න තමයි ඒක නම වෙනස් කර නොතිබුනේ. සනී මන්නත්‍රතුමා ඒ කරපු කාර්යය රවිනාත් ගුණසේකර මැතිතුමා අත් දෙකම ඔසවලා එදා සිට නීතියක් බවට පත් කලා. ඒක නිසා ප්‍රකාශන ඔප්පු වලට හදනවානම් මම නොදැනුවත්වම මගේ ගෙදරටත් ඒ ටි හරවයි. අත්පොඩි ගහනකොට ගහනන්න ඕන අත්පොඩිය ගහපු කෙනාට ප්‍රසංශාවක් තිබුනොත් විතරයි.ගහපු කෙනාට ගෞරවයක් තිබුනොත් විතරයි. ඔය අත්පොඩි ගහපු එක්කෙනාම අත්පොඩිය ගහ ගත්තේ තමන්ගෙම පැත්තට කණගාටුයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ කරුණ සම්බන්ධයෙන් යමක් කියනවා නම් එතුමා කිව්වේ මෙතන වැඩේ කර ගන්න රස්තියාදු වීම සම්බන්ධයෙන්. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි මම එතුමා ගේ ඔප්පුව පෙන්නනකොට මම දැක්කා සීල් එකක් ගහලා තියෙනවා. ඒ සීල් එක ගැහැව්වම ඒ නිළධාරිනිය කියලා තියෙනවා බිම් සවිය සහතිකය ගේන්න කියලා. ජනතාව බිම් සවිය ගැන දැනුවක් නැහැ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි ජනතාව දැනුවත් කරන්න මෙන්න ලේඛණ ගේන්න කියලා පහදලා දෙන්න කියලා. ගරු නගරාධිපතිතුමනි, එතුමා අවසානයට කිව්වා බිම් සවිය තිබුනා සිල් එක නැහැ කියලා. එතුමාට බිම් සවිය සම්බන්ධයෙන් දැනුමක් නැති කම තමයි පෙනුනේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය ,ඔබතුමිය කියන එක වැරදියි.ඒ ටී පුරවල මම ගෙවල් වලට ගිහිල්ලා බෙදලා තියෙනවා දහස් ගානක් මන්ත්‍රීකාලේ. මෙතනට එන අයට කියන්නේ ප්‍රකාශන ඔප්පුවක් තියෙනවා නම් තමයි බිම් සවිය ගේන්න කියන්නේ. ප්‍රකාශන ඔප්පුවත් අවුරුදු 20 ක් වලංගු නම් අපි එතනින් එහාට අහන්නේ නැහැ. මේකට තවම අවුරුදු 11/2 ත් නැහැ. මගේ ගමේ ග්‍රවුන්ඩ් එකට එහා පැත්තේ තියෙන කොටස එක කාලයක් ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමා එතකොට දීපාල් උත්තොටුව සම්බන්ධිකරන ලේකම් මායිම් ගහලා බෙදන්න එනකොට අපේ සුසන්ත මන්ත්‍රීතුමාගේ බාප්පා නිමල්සිරි තමයි කනු ටික ගලවලා ඉඩම බේර ගත්තේ. විල්ලෝරාවත්තේ එකේ අයිතිකාරයෝ ජීවතුන් අතර තාම ඉන්නවා. ඒ නිසා ඔබතුමිය ඔය නොදන්න දේවල් ගැන කථා කරන්න යන්න එපා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මම අත්පුඩියක් ගැනවත් , ප්‍රකාශන ඔප්පුවක් ගැනවත් නොවෙයි කථා කලේ. නිලධාරින් එතුමාට ඒ සම්බන්ධව පැහැදිලි කර නොදීම ගැන මම කථා කලේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒක මන්ත්‍රීතුමා ගන්න කලින් සුදත් ක්‍රිෂාන්ත ඒ ගැනු කෙනාට තිබ්ලා තියෙන්නේ ප්‍රකාශන ඔප්පුවක්. ඒ ප්‍රකාශන ඔප්පුව නිසා තමයි උසාවි නියෝගයක් ගෙනල්ලා තියෙන්නේ. ප්‍රකාශන ඔප්පුවක් තියෙනවා නම් අනිවාර්යයෙන්ම බිම් සවිය ඔප්පුවක් තියෙන්න ඕන. ඒක එතුමා දැනුවත් වෙලා නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, එතුමාව දැනුවත් කලා නම් එතුමා අද ඔය ප්‍රකාශයකරන්නේ නැහැ. ඒකයි මම කියන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය ,ඔබතුමිය දන්නවද දැනුවත් වෙලාද නැද්ද කියලා.දැනුවත් වෙලා ඉවරයි. ඔය කියන ක්‍රමවේදය තුල ඒ ටි හරවන්න බැහැ. ඒක කවුද කියන එක නොවෙයි වැදගත් වෙන්නේ. ඒ ටි හරවන්න ක්‍රමවේදයක් තියෙනවා . ක්‍රමවේදයෙන් එහාට යන්න බැහැ.

**3(17) <u>මහ නගර සභා මන්ත්‍රී - පී.ගාවින් මත්තෙස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම විපක්ෂ නායක වෙලා සභාවේ මුලින්ම කථා කරන කොට ඒ කථාවෙන් ඔබතුමාට දෝෂාරෝපණයක් කරන්න වෙන්නේ. ගියවර සභාවේදි ඔබතුමා මුදල් කමිටු වාර්තාවට ඡන්දය දෙනවද කියල කියනකොට සභාව හමාර කරලා ගියා. ඊට පස්ව තව අයිතම් දෙකක් තියෙනවා. පෞද්ගලික කරුනු හා වෙනත් කරුනු අපිට ඒ අවස්ථාව නැතුව ගියා ගරු නගරාධිපතිතුමනි.මින් ඉදිරියට එහෙම කරන්න එපා කියලා ඉල්ලා සිටිනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - පී.ගාවින් මත්තෙස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අද රටේ ජනතාව බයෙන් ඉන්නවා කොරෝනා බය, පොල් තෙල් බය. ජීවන බරේ බය.ලංකාව තුල තුන් බියක් හැදිලා තියෙනවා. අපිට කොරෝනා ගැන වාර්තාවක් ලබා දෙන්න. කොරෝනා රෝගීන් කී දෙනෙක් ඉන්නවා ද? මරණයට කී දෙනෙක් පත් වුනාද? නිරෝධානය කී දෙනක් කලාද කියලා අපිට පැහැදිලි වාර්තාවක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**3(18) <u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග එන් අපොන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ කාල පරිච්ඡේදය තුල නොයෙක් නොයෙක් තැරැව්කාරයින්ගේ ග්‍රහනයකට හසු වෙලා තියෙන නගර සභාවට සේවය කර ගන්න එන ජනතාව. මෙවැනි කාරණා පසුගිය සභා වලදිත් ප්‍රකාශ කරලා තියෙනවා.ඒවගේම එකක් තමයි මේ ඉදිරිපත් කරන්නේ. නගර සභාවෙන් යම් කාරණාවක් ඉටුකර ගැනිමට පැමිණි විට යම් යම් අඩුපාඩු සකස් කරගෙන එන්න කියලා කියනවා. අපගේ වරිපනම් ලේඛනයට නම ඇතුල් කරන්න තියෙන කාලය ප්‍රමාණවත් නොවන නිසා අදාල දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන ලේඛනවලට කූට ලේඛන ඉදිරිපත් කරන ඇතැම් මහත්වරු අපට වසර 20-25 පමණ ලේඛන ඉදිරිපත් කරන්න කිව්වම මිට පෙර හිටපු ඇතැම් නොතාරිස් මහත්වරුන්ගේ ලේඛණ අරගෙන දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරින්ගේ පියන්ලාවත් සම්බන්ධ කරගෙන කූට ලේඛණ සකස් කරගෙන අදාල කටයුතු කරගන්නවා. මේකට මගේ මන්ත්‍රිධුරයේ වසර 19 ක් තුල එදා සිට අද දක්වාම මේ කූට ලේඛණ සකස් කරන යම් යම් මහත්වරු ඒවා දිගටම කරගෙන යනවා.අපි මහජන නියෝජිතයින් විදියට ජනතාවට සේවයක් කරනවානම් මේ කූට ලේඛණ සකස් කරන යම් යම් උදවියව නීතියේ රැහැනට හසුකර ගත යුතු වෙනවා. ජනතාවට ලොකු පිඩාවක් ඒවගේම තමන්ගේ රාජකාරිය ඉටු වෙන්නෙත් නැහැ මුදල් ගැරිමක් පමණයි සිදු වෙන්නේ. විශේෂයෙන්ම කර්මාන්ත කමිටු සභාපති වශයෙන් මගේ නමින් ඉදිරිපත් කලා ව්‍යාජ ලේඛණයක් සකස් කිරිම සම්බන්ධයෙන් මාස 3 ක් ගත වෙනවා කිසිදු පිලිතුරක් නැහැ. කල්දමුල්ල, ලක්ෂපතිය, ලුනාව සහ අගුලාන බල ප්‍රදේශ වල පීබී ඩබ්. වශයෙන් තමයි සඳහන් වෙන්නේ එවැනි පුද්ගලයින්ට තමයි මේ කූට ලේඛණ සකස් කරලා තියෙන්නේ. සභාවට වන අපකීර්තිය සම්බන්ධයෙන් අදාල වරිපනම් ලේඛණයේ නම තිබෙන පුද්ගලයව නගර සභාවට ගෙනල්ල නීතිය ඉදිරියට ගෙනියන්න පුලුවන්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු කොමසාරිස්තුමා, මෙතුමා මේ කාරණය සම්බන්ධයෙන් කථා කරන තුන්වෙනි වතාව මේ. ඒ දෙපාරකදිම අධිකරණ ක්‍රියාවලියක් තියෙනවා කිව්වා. පරික්ෂණයක් කරනවා නම් එය මන්ත්‍රීතුමාව දැනුවත් කරන්න ඕන.

**මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග එන් අපොන්සු මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඒ සම්බන්ධව ස්තුතිය පුද කරන අතර, කූට ලේඛණ සකස් කරන අය නිතියේ රැහැනට හසු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**3(19) මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, ඉදිබැද්ද මෙතෝදිස්ත පල්ලිය පංති මූලිකයා විසින් ඉදිරිපත් කරන ලිපියකි න් ඉල්ලනවා මෙතෝදිස්ත විදුහලට යාබද පාර විදුහල් පාර කියලා කියන්නේ එතන ඉහල ඉදිබැද්ද පාරට සම්මුක වන තැන නාම පුවරුව තියෙනවා. පහල ඉදිබැද්දෙන් පාර අවසන් වෙනවා එතනට නාම පුවරුවක් නැහැ.ඒ නාම පුවරුව සවි කරන ලෙස ඉල්ලා සිටිනවා.

**3(20) මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් මට ස්තුතියක් එක්ක ලිපියක් ඉදිරිපත් කරන්න තියෙනවා.සාමාන්‍යයෙන් පලාත් පාලන ආයතන වලට ජනතාව බලය දෙන්නේ කුණු අපායෙන් මුදවා ගන්න තමයි ප්‍රධාන කාරණාව.මේ සඳහා කරන යෝජනාවන් පක්ෂ විපක්ෂ භේදකින් තොරව කරන්න ඕන. මම විශේෂයෙන් ඔබතුමාට ස්තුති කරනවා ඔබතුමා එය පිලිඅරගෙන කටයුතු කිරිම සම්බන්ධව.

**3(21) මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, පොලිසියේ තේමාව තමයි ධම්මෝ හවේ රක්ඛති ධම්ම චාරි කියලා. හැබැයි අද මොරටුවේ පොලිස් ස්ථාන හතරේ තිබෙන පොලිස් නිලධාරින්ගේ හිතේ තියෙන්නේ ඒක නොවෙයි. හිතේ තියෙන්නේ අනිච්චාව සංඛාර කියලා. හේතුව තමයි පොලිසිය කොයි වෙලාවේ කඩාගෙන වැටෙයිද කියලා දන්නේ නැහැ.ඒවගේම පැමිණිල්ලක් දාන්න ආවාම වාඩිවෙන්න පුටුවක් නැහැ. මම මන්ත්‍රී වැටුපෙන් පුටු අටක් අරගෙන දුන්නා ඒ වගේම ලිපිද්‍රව්‍ය අරගෙන දුන්නා.ඒ පොලිසි වල අඩුපාඩු සකස් කිරීමට කටයුතු කරන්න කියලා විශේෂ ඉල්ලිමක් කරනවා.

**3(22) මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2020.12.03 දිනෙන් පරිපාලන චක්‍රලේඛය 7/2020 නිකුත් කරලා තිබුනා ගමන් වියදම් දිමනා සම්බන්ධයෙන්. ඒ යටතේ අපිට ආසන්න පලාත් පාලන ආයතනවල ගෙවිම් කටයුතු කරලා තියෙනවා නමුත් අපේ නගර සභාවේ ගෙවිම් කරලා නැහැ. එම නිසා මා ඉල්ලිමක් කරනවා ඒ අනුව අපේ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරික්ෂක වරුන්ට හා පවුල් සෞඛ්‍ය සේවිකාවන්ටත් ගෙවිම් කටයුතු කිරිමට සලස්වා දෙන ලෙස.

**3(23) මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාටත් ආරාධනාවක් ලැබිලා ඇති. ලුනාව ආයුර්වේදයේ සහනසුබෝදන් කියලා ආබාදිත දරුවන්ට සායනයක් ආරම්භ කරලා තියෙනවා. ඒකට භාහිරෙන් ලබාදෙන බෙහෙත් වර්ග ලබාදිය යුතුයි.ඒ අවශ්‍යතා වලට මා සහ මගේ පිරිස රු. 58000/- ක් සොයා දුන්නා.මම ඉල්ලිමක් කරනවා නගර සභාවක් විදියට මැදිහත් විම කරන්න කියලා.

**3(24)** **<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ආයාචනයක් ඉදිරිපත් කරලා තියෙනවා නවෝදනි සොයිසා මහත්මිය, 84 ඒ මෝල්පේ පාර, මොරටුව. කාණු පද්ධතිය සකස් කරන්න කියලා. මම ලිපියසභාගත කරනවා.

**3(25)** **<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,ඉදිරිපස තිබෙන මධ්‍යම වෙළඳ පොල සකස් කිරිමේදි මීට කලින් මහ නගර සභා අමාත්‍යාංශයෙන් දායකත්වය දුන්නා වගෙම අපි ණයක් ගන්නේ නැතුව මේ කටයුත්ත කර ගමු කියන අදහස තමයි දෙන්නේ.

**3(26)** **<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ක්‍රිඩා කමිටු සභාපති වරයා වශයෙන් දැනට අපි විල්ලෝරාවත්ත බොරලුව ක්‍රඩාංගනය තණ තීරු , මැටිවත්ත ක්‍රිඩාංගනය විකට්ටුව, ලුනාව කලපුව විකට්ටු දෙකක්,ලක්ෂණපතිය ප්‍රජාශාලා ක්‍රීඩාංගනය විකටුව, විල්ලෝරාවත්ත බොලිබෝල් ක්‍රිඩාංගනය , සොයිසා පුර පැති විකට්ටු තුනක් සහා සැහැල්ලු පන්දු විකට් දෙකක්,ඒවගේම වොලිබෝල් ක්‍රිඩා පිටිය, ජයගත් පුර ඉදිරියේදි අලුත්වැඩියා කරනවා. ඇත්තටම අපේ යම්කිසි වාසනාවකට ලංකාවේ පලවෙනි කියුරේට කෙනෙක් ලැබිලා තියෙනවා දුමින්ද මහත්මයා.ඒ වගේම මට මේවා සකස් කිරිමට සංඛ මහත්මයා විශේෂ උනන්දුවක් දැක්වුවා එතුමා විකට් තණතීරු සකස් කිරිමට ක්‍රිකට් ආයතනයේ පාඨමාලාවක් හදාරපු කෙනෙක්. නමුත් කැතයි කියන්න මේ වගේ සංවර්ධනයක් වෙනකොට විවේචනය කරන්න කොටසක් ඉන්නවා. සොයිසා පුර ක්‍රිඩාංගනයට ස්පෝට්ස් කම්ප්පැලැක්ස් එකක් හදන්න තමයි අදහස් කරලා තිබුනේ නමුත් මාධ්‍ය අරගෙන ඇවිල්ලා මිනිස්සු කට්ටියක් ඇවිල්ලා කිව්වලු සමන්ලාල්ගේ පුතා මේවා වලින් ගසා කනවා කියලා. මම මේ සභාවේ විවෘත අභියෝගයක් කරනවා මේ කරපු කිසි දේකට අනිස් ලෙස මුදල් දිලා තියෙනවා නම් මම මන්ත්‍රිධුරයෙන් ඉල්ලා අස් වෙනවා. ඇත්තටතම අපිට මිනිස්සු කියනවා ඔබතුමන්ලා මේ කරන්නේ ලොකු දෙයක් පැති විකට්ටුව හදනවා කියන්නේ නගර සභාවට ආයෝජනයක් නගරාධිපතිතුමනි. මාධ්‍ය ගෙනල්ලා සංදර්ශන කරමින් සමන්ලාල්ගේ පුතා ඉදිරියේදි චන්දය ඉල්ලන්නේ මම කියන්නේ සමන්ලාල්ට ගහන්න මේ වගේ තරුණ ළමයින්ට ගහන්න එපා. නගර සභාවට එන්න පුලුවන් නම් මම මේ ආසනය ඒ ළමයට දෙනවා. අපි වයසයි තරුණ ළමයින්ට අවස්ථාව දෙන්න ඕන. අයි සි සි එකට මුදලදක් ගෙව්වා ඇරෙන්න සතයක් වත් ගෙවලා තියෙනවා නම් අහන්න අයිතියක් තියෙනවා. එහෙම නොකර කැත විදියට විවේචනය කර කර යන්න එපා. මම ගරු මන්ත්‍රීවරුන්ට කියනවා මේ වගේ පහත් වැඩ කරන්න එපා කියලා.

**3(27)** **<u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව සිංහ සමාජයෙන් අභියාචනා යටතේ මා වෙත ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. මේ සිංහ සමාජයේ ශාලාව කොරළවැල්ල වාග් වර්ධන ශාලාව ගරු ලලිත් නෝනිස් නගරාධිපතිතුමා විසින් තමයි සිංහ සමාජයට ලබා දිලා තියෙන්නේ. මේ ශාලාව නැවත නගර සභාවට පවරා ගැනිම සඳහා මොරටුව දිසා අධිකරණයේ නඩුවක් පවරලා තිබුනා කියලා නගර සභාවෙන්.නගර සභාව පැරදුනා. ඊට පස්සේ ගල්කිස්ස අධිකරණයේ ඇපලයක් ඉදිරිපත් කරලා තියෙනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, බොරු කියන්නේ නැතුව ඉන්න. එක්සත් ජාතික පක්ෂයට ලැජ්ජයි.

- සභා ඝෝෂා -

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම අතිශයින්ම කණගාටු වෙනවා එක්සත් ජාතික පක්ෂයෙන් මේ නගර සභාවට පත්වෙලා ඉන්න මන්ත්‍රීවරු කථා කරන්න ඕන ඕකද? නඩුව පැරදිලා තියෙනවා නම් මේක නගර සභාවට ගන්න කියන්නේ නැතුව අනිත් එක ඔයාගේ නඩුව ගැන පොඩ්ඩක් අනිත් පැත්ත හැරිලා බලන්නේ නැතුව කථා කලොත් හොඳයි මන්ත්‍රීතුමා. කරුණාකරලා ඉඳගන්න ලැජ්ජා නැති වැඩ කරන්නේ නැතුව. මන්ත්‍රීධුරයට ඇවිල්ලා සභාවේ දේපල වලට පොලිසි ගිහිල්ලා ලැජ්ජා නැති වැඩ.අර එහා පැත්තේ ඉඳගෙන රුපියලක් සභාවට ගන්න දඟලන දැඟලිල්ල අර මන්ත්‍රීවරු හතර දෙනෙක් අන්න එහෙමයි මන්ත්‍රීවරු කියන්නේ. ජනතා විමුක්ති පෙරමුණ මන්ත්‍රීවරු.ඉල්ලා අස්කර ගන්න ඕක මහ අවනම්බුවක්.

<u>මහ නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මන්ත්‍රීවරයෙක් විදියට සභාවේ කරපු බරපතල ප්‍රකාශයක් නඩුව පැරදුනා කියන එක කරුණාකරලා ඒක ඉල්ලා අස්කර ගන්න නැත්නම් කොමසාරිස්තුමා හරහා හරි ප්‍රකාශයක් කරන්න නඩුව සම්බන්ධයෙන් ඇත්ත තත්වය.

<u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සිංහ සමාජය විසින් ඉදිරිපත් කරලා තිබෙන එක තමයි මම ඉදිරිපත් කරලා තියෙන්නේ. ඒක එතුමන්ලත් එක්ක බලාගන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මේ සම්බන්ධයෙන් ආයතන කමිටුවේ තියෙනවා 2003.09.02 දින තීන්දුව ලබාදිලා තියෙන්නේ මොරටුව දිසා අධිකරණයෙන්. නඩු අංක 94/2000/නෙරපිම මේක නියෝගය දිලා තියෙන්නේ. වාග් වර්ධන එක අයින් කරලා නගර සභාවට බලය ගන්න. නගර සභාවට ගන්නවා විතරක් නොවෙයි නගරාධිපතිතුමා නගරසභාවට මුදල් නොගෙවපු කාල සීමාවේ සිට ඒ අයනගර සභාවට භුක්තිය බාර දෙනතුරු අදාල කාල සීමාව තුලම රු.1000/- ගානේ මාසෙකට අපිට ගෙවන්න ඕන.ඒ විතරක් නොවෙයි ඒගොල්ලො ගල්කිස්ස මහාධිකරණයට ගියා, ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා සෑම තැනකින්ම එම තීන්දුව තමයි ලැබුනේ. ඒ නිසා පැහැදිලිව කියනවා මේක නගර සභාවට පවරා ගන්න කියලා. පවරා ගැනීමේ අඩුවක් වෙලා තියෙනවා අපේ හිටපු නීතිඥ මහත්වරුන්ගෙන්. නඩු කමිටුවේදි ඔබතුමා තමයි මේක මතුකලේ. ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා කිව්වට පස්සේ තමයි අපි මේක සොයාගෙන ගියේ. ඒක ඔබතුමාට මතක නොතිබුනානම් එහෙම මේ දේ වෙනවා. ප්‍රදීප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා දිගින් දිගටම ෆයිට් කලා මේ සම්බන්ධව.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට උදවු කරන්න නොවෙයි මේ කථා කරන්නේ. මේ වෙනකොට නෙරපිමේ නියෝගය දැම්ම සඳහා කටයුතුත් කරලා ඉවරයි යූ.ඩී.ඇට් එකෙන් නෙරපිමේ නියෝගයක් අධිකරණයට නියෝගය ලැබෙන්න ඔන්න-මෙන්න තියෙන්නේ.දන්නේ නැති දේවල් කථා කරන්න එපා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් මේ වෙනකොට මොරටුව අධිකරණයේ වෙනම නඩු දෙකක් දාලා තියෙනවා. අපි කිව්වා මේ නඩු තීන්දුව මොරටුව අධිකරණයට භාර දීලා ඒ නඩු දෙක අපි ඉල්ලා අස්තර ගන්නවා හේතුව තීන්දුව දීලා ඉවරයි මේ අයව පන්නන්න කියලා. මේ සම්බන්ධව පැහැදිලිව ආයතන කමිටුවේ තියෙනවා. ඒ නිසා මන්ත්‍රීවරුන්ට කියනවා කරුණාකරලා කමිටු වාර්තාව කියවලා බලල සභාවට එන්න.

3(28) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.රවිනත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මීට අවුරුද්දකට කලින් ඔබතුමාට යෝජනාවක් කලා මහ නගර සභාව ඉදිරිපිට තිබෙන බාලදක්ෂ මාවතේ බර වාහන ගමන් කිරීම තහනම් කරන්න කියලා ඔබතුමා ඒක ක්‍රියාත්මක කරලා බෝඩ් එකක් ස්ථාපිත කලා. නමුත් ඒ පාර ප්‍රතිසංස්කිරිමෙන් අනතුරුව ඒ බෝඩ් එක දැන් එතන නැහැ. යලිත් ඒ බස් ගමනා ගමනය කරනවා නැවත වරක් බෝඩ් එකක් ස්ථාපනය කරන්න කියලා ඉල්ලා සිටිනවා.

3(29) <u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.රවිනත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ විශේෂ ඉල්ලීමක් මත මම ජාත්‍යාන්තර සම්බන්ධකම් සම්බන්ධව පක්ෂ භේදයකින් තොරව මොරටුවටත් ඔබතුමාටත් ශක්තියක් වෙන්න මම ඉදිරිපත් වෙලා ඔබතුමා දන්නවා අපිට සිටිනෙට් ආයතනය අපි පැරණිම සාමාජිකයින් අපිව අයින් කරලා තිබුනේ. නමුත් ඔබතුමාගේ ඉල්ලීම පරිදි මම ඉල්ලීම් කරලා ලිපි කීපයක්ම ඉදිරිපත් කරලා අපිව සිටිනෙට් ආයතනය නැවත වරක් සාමාජිකයින් කලා අපේ ජොෂ්ඨත්වය බලලා 2013 දක්වා ගෙනියලා අලුත් අය හැටියට නොවෙයි. දැන් මේකෙදි අපි එකඟ වුනා ඒගොල්ලේ අපිට අවුරුදු 8 ක හිඟ මෙම්බ ෂිප්ට් එකක් ගෙවන්නකියලා තිබුනා. නමුත් අපි ඉල්ලීම් කරලා අපි කිව්වා 2019 සිට අපි මේ මුදල ගෙවන්නම් අපිට මෙම්බ ශිප්ට් එක දෙන්න කියලා. ඒ අනුව දැන් අපිට ෆුල් මෙම්බ කෙනෙක් කරලා තියෙනවා. නමුත් ඒගොල්ලො දිගින් දිගටම මගේත් එක්ක ටෙලිපෝන් එකෙන් කථා කරනවා ඊ-මේල් එවනවා අපි මෙම්බර් ශිප්ට් එක ගෙවලා නැහැ. මේ හේතුව නිසා මම ඉල්ලීමක් කරනව ඔබතුමාගෙන් අපිට ඩොලර් 5000/- ක ප්‍රධානයක් ගිය මාසේ ලබා දෙන්න තිබුනා. මගෙත් එක්ක පෙලිපෝන් එකෙන් ඒ අය දෙවතාවක් කථා කරලා මට ඒ සම්බන්ධව ඉදිරිපත් කරන්න දේවල් කිව්වා. මම ඒ දේවල් ඉදිරිපත් කලා. එකේ පලවෙනි වාර්කය තමයි රු. 5000/- සමහරක් වෙලාවට රු.1000/- ක් 15000/- ක් විතර ලබාගන්න පුලුවන් මොරටුව නගරයට. නමුත් අපේ මේ මෙම්බර් ශිප්ට් එකේ තියෙන ප්‍රශ්ණය නිසා ඒ අය මේ ගැන වැඩි උනන්දුවක් දක්වන්නේ නැහැ පලවෙනි එක. දෙවනි එක අවුරුදු හතර කට වතාවක් පවත්වන සිටිනෙක්ට් මහ සභාව එතන තමයි අලුත් කාරක සභාව පත් කරන්නේ ඒක නොවැම්බර් මාසේ

පවත්වනවා. ඒක මට ඔබතුමාට දැනුම් දෙන්නත් කිව්වා. එතන ඔබතුමත් ආරාධිතයෙක් විදියට යා යුතුම ස්ථානයක්. මේක කරන්න නම් අපි මේ මුදල් ගෙවීම කර යුතුයි. ඒකට ඔබතුමාගේ පූර්ණ අවධානය යොමු කරන්න ඕන ස්ථානයක් අපිට ප්‍රයෝජන ගොඩක් ගන්න පුලුවන් ස්ථානයක්. ඩොලර් 1300 ගානේ තුනක් තියෙනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, නෑ ඒක අපි ක්‍රියාත්මක කරනවා.

**3(30) <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පලමුව තමුන්නාන්සේට ප්‍රසංසා කරනවා ඒ අන් කවරක් නිසා නොවෙයි මොරටුව මහා නගර සභාවේ මහ සභාව විනයක් සහිත සභාවක් බවට පත් කලා. ඒ විතරක් නොවෙයි මේ සභාව සටන් කාමි සභාවක් බවට පත් කලා. මේ සභාවේ පෙත්සම් පැමිණිලි අයිතමය අද වැදගත් අයිතමයක් ඒ තමයි කම්ටු සංවාද කරන්න තියෙන අවස්ථාව ඇහුරුනාම මන්ත්‍රීවරු ප්‍රධාන කොට ජනයාගේ ප්‍රශ්ණත් තමන්ගේ ප්‍රශ්ණත් පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ ඉදිරිපත් කරනවා. ඒ නිසා පෙත්සම් අයිතමය යටතේ අපිටත් යම් කරුනු ප්‍රමාණයක් පෙත්සම් ලෙස ඉදිරිපත් කරන්න අවස්ථාව ගන්නවා. ගරු නගරාධිපතිතුමනි සමහර වෙලාවට සතුට වෙන ගමන් දුකුත් වෙනවා. දැන් මන්ත්‍රීවරයෙක් තමන්ගේ අයිතිය පිලිබඳව ඉතාම ගැඹුරින් කිවයුතු කිවනොයුතු සියල්ල කියද්දි තමුන්නාන්සේගේ පාලනයට අවුරුදු ගානක් කියලා දැඩි විවේචනයක් කරද්දි එක හඩක් ආපු නැති ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ අත්පුඩියක් ගහපුවම මරන් කන්න හදනවා. ඒකට තමයි සටන් කාමීත්වය කියන්නේ. ගරු නගරාධිපතිතුමනි මගේ පලවෙනි පෙත්සම මේ දවස්වල විකාර හීන පෙනවා ඒවායේ පොඩි ආස්වාදයකුත් තියෙනවා. ඒ ආස්වාදය මම අත්මාර්තකාමි විදියට ගන්නේ නැතුව එකෙන් තොරගත්තු සමහර ඒවා මේ සභාවෙත් මොරටුව ජනතාවගෙත් යහපත වෙනුවෙන් පරාර්ථකාමි හැඟීමකින් ඉදිරිපත් කරනවා. ගරු නගරාධිපතිතුමනි නින්ද ගිය ගමන් ටිකක් ඈතින් හඩක් ඇහෙනවා. ඒ හඩ තමයි හොට්ට පරා-හොට්ට-හොට්ට පරා කියනවා. මට නිකං හඩ අහෙන විදියට හොයලා බැලුවා බලනකොට මේ හීනෙන්. සුවඳකුත් නැති කුමාරයකුත් නොවන පුෂ්ප කැහැ ගහනවා. මට හිතාගන්න බැහැ මේ වෙලාවේ මීට පෙර නම් කාලයක් ඔය කැහැ ගැහිල්ල කැහැ ගැහැවුවා. හැබැයි දැන් මොකද මේ කැහැ ගහන්නේ. එතකොටම කණ ගාවින් ඇහෙනවා දොරහොටුවා - දොරහොටුවා - දොර හොටුවා ගානවා. අයිත් බැලුවා මේක වෙන්න බැරි වැඩක් මේ දෙන්නගෙම නුල තනි අතක තියෙන්නේ.මේ වෙලාවේ කවදක්වත් මට කොච්චර සැකයක් තිබුනත් එහෙම වෙන්න බැහැ.ඊලඟට බලනකොට දෙන්න එකට මූණ බලාගෙන කියනවා මාර කතාවක් කම්ස්කොකා-කම්ස්කොකා-කම්ස්කොකා කියනවා මේ මොකක්ද මේ කියන්නේ හිතා ගන්න බැරි එකක් ඇතුලේ ඊලඟට පුෂ්පෙ කැහැ ගහනවා පට්ට මෝල - පට්ට මෝල කණ ගාවින් කැහැ ගහනවා මොට්ට පාල - මොට්ට පාල කියනවා. මේ විකාර හඩ ඇතුලේ මට දැන් නමක් ආවා මම කල්පනා කලා ඔය පාල කියන කෑල්ලෙන් ඉවර වුනානෙ බැලුවා එතකොටම පුෂ්පෙ කැහැ ගහනවා අස්ස පිටින් - අස්ස පිටින් - අස්ස පිටින් කණ ගාවින් කැහැ ගහනවා දඩිං බිඩිං-දඩිං බිඩිං මේක හොඳට මම සිහිය ඇතුව නැගිටලා සිහි කල්පනාවෙන් කල්පනා කරනකොට මට මතක් වුනා මේ කියන්නේ වෙන මොකක්වත් නොවෙයි ජනවාරි මාසේ මේ සභාවේ සම්මත කල යෝජනාවක් ඒ යෝජනාව තමයි මොරටුවේ රේස් බයි ස්ථාන වලින් ව්‍යාාපාරික බලපත්‍ර ගාස්තු අය නොකිරිමේ යෝජනාව. අපිත් පක්ෂයි. එදා මේ කියපු සිංදු කවි වාර්තාවේ තියෙනවා. අසු පිට නැඟි කතන්දර විශාල කතන්දර මම පහුවෙනිදා ගියා මොරටුවේ රේස් බයි වලට තිබුනට වඩා හොඳින් බයි

වැඩ.පොඩ්ඩක් කථා කලාම අවෙත් පට්ට උත්තරයක් ගරු නගරාධිපතිතුමා එගොල්ලො කියනවා ලංකාවේ එකම නගරාධිපති මොරටුවේ නගරාධිපති අපිට මෙහෙම බදු සහනයක් දුන්න. බලපත්‍ර ගාස්තු අයින් කරපු එකම නගරාධිපති. මට එතනින් එහා කථා කරන්නට දෙයක් නැහැ. එන්න හැරෙනකොට කෝචෙක් එකට කියනවා අම්මා - මුත්ත - පනත්තා - කිත්තා - කිරිකිත්ත - පනත්තා මොන කිරි කිත්තා කිව්වත් අපි නගරාධිපතිට තමයි චන්දය දෙන්නේ. ඇයි නගරාධිපති අපිට අපි නගරාධිපතිට. බදු අයින් කරලා. මොරටුවේ බුලත්විට කඩේනුත් බද්ද අය කරනවා. සාධාරණ ලෙස උපයන හැම දෙනාගෙන්ම ව්‍යාපාරික බදු අය කරන වා. හැබැයි බයි වලින් බද්ද අය කරන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා කියන්න ජනවාරි මාසේ ගත්තු යොජනාව සම්මත කරපු මේ වෙනකොට ගත්තු ක්‍රියාමාර්ගය කියන්න. එරගොල්ලෝ කියනවා අපිට කිසි දැනුම්දිමක් නැහැ අපි රේස් බයි පවත්වාගෙන යනවා. අපිට ලියුමක්වත් එවලා නැහැ. මොකක්ද ගත්තු ක්‍රියාමාර්ගය දැන් රේස් බයියනවා බලපත්‍ර ගාස්තු නැතුව මේ සභාව විශාල වරදක්නේ මේ කරන්නේ ඒ නිසා ගරු නගරාධිපතිතුමනි මගේ පෙත්සම තමයි ඕන්න ඕක. ඉදිරිපත් කරපු විදික්‍රමය තමයි අර. එක නමක් ඉලක්ක කරගෙන මගේ හිනේ දැක්කේ. හැබැයි ඇත්ත හොයලා බලනකොට මාර අර්බුදයක මොරටුව මහ නගර සභාව බලනකොට සමන්ලාල් නගරාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ලංකාවේ එකම නගරාධිපතිවරයා විදියට රේස්බයි මේ දෙරණ, අරුණ මාධ්‍ය වාර්තා කරනවා මොරටුවෙ රේස් බයි නවත්වයි. ඒ නිසා කරුණාකරලා මේ ආයතනයට එන්න තිබ්ච්ච බද්දක් ඉවත් කිරිම පමණක් නොවෙයි. පොඩි මිනිහෙක් බද්ද ගෙව්වේ නැත්නම් අපි නඩු දානවා. දැන් බද්ද ගෙවන්නේ නැතුව තමන් සතුටින් රේස් බයි පවත්වාගෙන යනවා. එක රේස්බයි එකක්වත් නැවතුනේ නැහැ. ඒ නිසා මේ අවධාරණය කරන්නේ මොරටුව මහනගර සභාවේ අපිත් එකතු වෙලා තමුන්නාන්සේලා ගෙනාපු යෝජනාවට නිකංවත් විරුද්ධ වුනා නම් බයි නවත්වන්න විරුද්ධ වුනා වගේ වෙනවා.අපි දැන් තීන්දුවක් අරගෙන තියෙන්නේ අය කරන්න බැහැ නිතිමය ගැටලුවක් තියෙනවා. හැබැහි තව දුරටත් බයි පවත්වානෙ යනවා නම් ආණ්ඩුව පැත්තෙන් මැදිහත් වෙලා මෙය වලක්වන්න ක්‍රියා මාර්ගයක් ගන්නේ නැත්නම් අපි ඒ බද්ද අයකරගන්න හරි කටයුතු කිරිම තමයි කරන්න වෙන්නේ. නැත්නම් ඒක අපි අනියම් විදියට එකඟ වුනා වෙනවා.බයි පවත්වාගෙන යන්න බදු සහන දෙන්න. අපි කාගෙත් එහෙම අරමුණක් නැහැ මේ සභාවේ. අපි කාටත් තිබුනේ පාරිශුද්ධ වුවමනාව මොරටුව ජනතාව සුදුවෙන් ගලවා ගන්න.හැබැයි සුදුවෙන් ගලවා ගන්න ගත්තු ක්‍රියා මාර්ගය අනිත් පැත්තට කැරකිලා ආවා බද්ද ඉවත් කරලා.

**3(31)** <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දෙවන කාරණාව තමයි මේ සභාවේ පැරණි ලිපිගොනු විනාශ කරන ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙන බව ආරංචි වුනා. මේ අදහස ඉදිරිපත් කරන්නේ අපේ පැරණි ලිපිගොනු අපේ ගොඩනැගිලි වල පුරවාගෙන ඉන්න ඕන තැන ඉදලා නොවෙයි. හැබැයි මේ හැම ලිපිගොනුවක්ම වැදගත්. මේ හැම ලිපිගොනුවකම එහි වැදගත් කම නොවැදගත් කම තීන්දු කරන විනාශ කිරිමට පෙර ආයතන නීතිය පිලිබඳ ස්ථාවර කමිටුව හරහා විනාශ කරන්නේ මොනවද නොකරන්නේ මොනවද කියලා තීන්දුවක් ගන්න අපේ කොමසාරිස් තුමා ප්‍රමුඛ අදාල නීති නිලධාරින්ගෙන් සමන්විත කමිටුවකින් තීන්දුවක් අරගෙන ආතයත කමිටුවට ගෙනල්ලා මේ සභාව දැනුවත් කරලා මේ සභාවේ අනුමැතියක් ඇතුලේ සිදුවිය යුතුයි කියන ස්ථාවරය ඇතුලේ අපි ඉන්නවා. එය එසේ විය යුතුයි. එසේ නැතුව විනාශ කරන හැම ලිපිගොනුවකම යම් නිශ්චිත මොහොතක ප්‍රශ්ණයක් ආවොත් කොමසාරිස්තුමා වග කියන්න ඕන. මහජනයාගේ මුදල් වියදම් කරන ආකාරය සඳහන් වන විවිධ ජනතා අවශ්‍යතා පිලිබදව සාක්ෂි ලෙස තිබෙන ලිපිගොනු ඒ

නිසා ඒ ලිපිගොනු සහා අනුමැතියකින් තොරව මේ වෙනකොටත් විනාශ වුන බව තමයි මගේ අවබෝධය තියෙන්නේ. නමුත් එසේ කර තිබෙනවානම් ඉතාමත් බරපතල විදියට අපිට විවේචනයක් තිබෙනවා වහාම විනාශ කර තිබෙන ලිපිගොනු වුනත් ඒ ලිපිගොනුවල අංක සහිතව වාර්තාවක් ආයතන ස්ථාවර කමිටුවට එවන්න.

**3(32) <u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

